වලස්මුල්ල අධ්‍යාපන කලාපය

2018

**3 ශ්‍රේණිය**

## සාධන විමසුම - අංක 02

කාලය පැය 1 යි. වි. 15 යි.

නම : පන්තිය :

(01) **පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

බලන බලන හැම තැනකම
කොළ පාටින් ගස් ගොඩයි
ගස් සෙවනේ සිටින විට දී
ගස් වැල් මිතුරන් වගෙයි.

පුංචි පුංචි ගස් ලොකු වී
දළු මල් පල හටගනියි
ඒ මල් පල සැමටම දී
මිතුදම තව වැඩි කරයි.

1. කවි පන්තියෙන් කියවෙන්නේ කුමක් ගැනද?

.............................................................................................................

2. ගස් වැල් වල හට ගන්නේ මොනවාද?

.............................................................................................................

3. එක ළඟ යෙදුණු සමාන වචන දෙකක් ලියන්න.

.............................................................................................................

4. කවියේ මිතුරන් ලෙස හඳුන්වා ඇත්තේ කවුරුන් ද?

.............................................................................................................

5. ගොඩ යන්නට සමාන පදයක් සොයා ලියන්න.

.............................................................................................................

6. ගස් වැල් මිතුරන් ලෙස දැනෙන්නේ කොහි සිටින විටද?

.............................................................................................................

(ලකුණු 06)

(02) **නිවැරදි වචනය යටින් ඉරක් අඳින්න.**

1. අපේ පුංචි (යාලුවෝ, යාළුවෝ) හරිම කීකරුය.
2. යුධ හමුදා (පෙලපාලි, පෙළපාළි) ගමන් කරයි.
3. ඈත අහසේ (වලාකුළු, වළාකුළු) පාවෙයි.
4. (හඳ එළියට, හඳ එලියට) වෙලේ ගොයම් නැවේ.

(ලකුණු 04)

(03) **හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරා ලියන්න.**

1. අපේ රටේ ................................ ජාතිකයන්ට යටත්ව තිබුණි. (ඉන්දීය, බ්‍රිතාන්‍ය)

2. ලංකාවට නිදහස ලැබුනේ ........................................ දී ය. (1948, 1915)

(ලකුණු 04)

(04) **වගුව ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

| | | |
|---|---|---|
| **අභිමානය** | **කව්දු** | **පුංචි** |
| **කුරුළු** | **ඕලු** | **කවඩි** |
| **පාන්දර** | **හිමිදිරිය** | |

1. උ ශබ්දය යෙදුණු වචන ගණන කීයද? ........................................
2. මහප්‍රාණ අක්ෂරය යෙදුණු වචනය යටින් ඉරක් අඳින්න.
3. සමාන තේරුම් ඇති පද තනි ඉරකින් යා කරන්න.
4. "ලොකු" යන්නට විරුද්ධ පදය සොයා කොටු කරන්න.
5. "ඉ" ශබ්දය යෙදුණු වචන සොයා ලියන්න.

........................................................................................................

(ලකුණු 10)

(05) **පහත වැකියේ අඩු පිල්ලම් යොදන්න.**

1. මම ගදර යන විට ම නරෙක් දක්කා.

(ලකුණු 06)

(06) "සමනලයෙක් කතා කරයි" මාතෘකාව යටතේ වැකි 3 ක් ලියන්න.

........................................................................................................

........................................................................................................

........................................................................................................

(ලකුණු 06)

(07) **අඩු අකුරු පුරවන්න.**

1. A - row  2. C - p  3. B - ll

(ලකුණු 06)

(08) **දෙමළ වචන වල තේරුම ලියන්න.**

1. මළසලකුඩම් - ........................................................................

2. නුලහම් - ........................................................................

**පහත සඳහන් වැකිය දෙමළ බසින් කියන අකාරය සිංහල අකුරින් ලියන්න.**

1. ඔබේ නම කුමක්ද? ........................................................................

(ලකුණු 06)

(09) **ගුණ කරන්න.**

1. $\begin{array}{r} 6 \\ \times\ 2 \\ \hline \\ \hline \end{array}$

2. $\begin{array}{r} 33 \\ \times\ 2 \\ \hline \\ \hline \end{array}$

(10) **විසඳන්න.**

එක ළමයෙකුට පැන්සල් දෙක බැගින් ළමයි 8 දෙනෙකුට දීමට අවශ්‍ය පැන්සල් ගණන කීයද? ....................

(11) **නිවැරදි පිළිතුර තෝරන්න.**

| | | | | |
|---|---|---|---|---|
| 1. | 2 × 7 | 1. 12 | 2. 18 | 3. 14 |
| 2. | 18 ÷ 2 | 1. 6 | 2. 9 | 3. 8 |

(12) රූපයේ පාට කර ඇති කොටස කාලක් ලෙස දක්වා ඇති පිළිතුර තෝරන්න.



1. $\frac{2}{4}$ 2. $\frac{3}{4}$ 3. $\frac{1}{4}$

(13) බාගයක් පාට කර ඇති රූපය තෝරන්න.

1.  2.  3. 

(ලකුණු 8)

(14) පහත ඝනවස්තු වල නම ලියන්න.

1.  ................................

2.  ................................

(15) රූපයෙන් ½ පාට කරන්න.



(16) පොත් දෙක බැගින් සිසුන් 3 දෙනෙකුට දීමට අවශ්‍ය පොත් ගණන කීයද? ................................

(ලකුණු 04)

(17) **පහත රූපය ඇසුරින් පිළිතුරු සපයන්න.**



1. ළමයාගේ දකුණු අත පැත්තෙන් ඇති රූපය කුමක් ද? ................................

2. ළිඳ ඇත්තේ ළමයාගේ කුමන අත පැත්තෙන් ද? ................................

(ලකුණු 04)

(18) අත්තක කුරුල්ලන් 16 දෙනෙකු වසා සිටියි.ඉන් කුරුල්ලන් බාගයක් පියඹා ගිය විට ඉතිරි කුරුල්ලන් ගණන කීයද?

.................................................................................................................

(19) වීදුරු බෝල 12 ක් ළමුන් දෙදෙනෙකු අතර සම සමව බෙදූ විට එක් අයෙකුට ලැබුණු ගණන කීයද ?

.................................................................................................................

(20) එකිනෙකට සමාන මුහුණත් 06 ක් ඇති ඝන වස්තුව කුමක්ද?

.................................................................................................................

(ලකුණු 06)

## පරිසරය

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) දාර දැති සහිත ශාක පත්‍රය යටින් ඉරක් අඳින්න.
1. කොට්ටම්බා 2. ගොටුකොළ 3. බුලත්

(02) පැළෑටියක ලක්ෂණයක් තෝරන්න.
1. ශක්තිමත් අතු ඇත. 2. ශක්තිමත් කඳක් ඇත. 3. උසට නොවැඩේ.

(03) ජාතික කොඩියේ රතු පසු බිමෙන් නිරූපනය වන ජාතිය කුමක් ද?
1. දෙමළ 2. මුස්ලිම් 3. සිංහල

(04) ජාතික කොඩිය ඔසවන විට,
1. පහසුවෙන් සිටිය යුතුය. 2. සීරුවෙන් සිටිය යුතුය. 3. ඉවත බලාගෙන සිටිය යුතුය.

(05) නත්තල් උත්සවය සමරන ජන කොටස වන්නේ,
1. කතෝලික 2. මුස්ලිම් 3. හින්දු

(06) ජාතියක් නොවන්නේ,
1. සිංහල 2.ඉස්.ලාම් 3. බර්ගර්

(07) පත්‍ර අතින් පොඩි කළ විට සුවඳින් හඳුනාගත හැකි ශාක පත්‍රයන් නොවේ,
1. බුලත් 2. කරපිංච 3. රෝස

(08) පඳුරු වර්ගයක් වන්නේ,
1. මිරිස් 2. උණ 3. කොස්

(09) ජාතික කොඩියේ බෝපත් 4 න් නිරූපනය වන්නේ,
1. ජාතික සමගිය 2. ජාතීන් 4 කි. 3. සතර බ්‍රහ්ම විහරණ.

(10) පත්‍රිකා රාශියක් එක ඉත්තක ඇති ශාකයකි,
1. කරපිංචා 2. ගස්ලබු 3. දෙල්

(ලකුණු 20)

**5.** වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාංකය | සංඛ්‍යා නාමය |
|---|---|
| 31 | ..................................... |
| ............. | හතළිය |
| 59 | ..................................... |
| ............. | දහනවය |
| 70 | ..................................... |
| ............. | තිස්හය |
| 85 | ..................................... |
| ............. | හැට දෙක |
| ............. | පනස් අට |
| 99 | ..................................... |

(ලකුණු 1 x 10 )

**6.** එකතු කරන්න.

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| 22 | 33 | 16 | 71 | 55 |
| +12 | +14 | +61 | +23 | +12 |

(ලකුණු 2 x 5)

**7.** අඩු කරන්න.

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| 16 | 35 | 48 | 65 | 99 |
| - 4 | - 12 | - 28 | - 30 | - 54 |

(ලකුණු 2 x 5 )

8.



(1) කුරුල්ලා සඳහා යොදා ඇති හැඩ මොනවාද?

1. ....................................... 2. .......................................

3. ....................................... 4. .......................................

(2) කුරුල්ලා සඳහා වෘත්ත කීයක් තිබේද?

.......................................................................................

(5x2)

**9.** හිස්තැන් පුරවන්න.

1. සඳුදා
2. ........................
3. බදාදා
4. ........................
5. ........................
6. ........................
7. ........................

(2x5)

## පිළිතුරු පත්‍රය.                                    3 ශ්‍රේණිය

(01) 1. ගස් වැල් ගැන  2. දළු, මල්, පල  3. පුංචි පුංචි
4. ගස්වැල්  5. පල  6. ගස් සෙවණේ

(02) 1. යාළුවෝ  2. පෙළපාළි  3. වලාකුළු  4. හඳ එළියට

(03) 1. බ්‍රිතාන්‍ය  2. 1948

(04) 1. 3 යි.  2. අභිමානය  3. පාන්දර, හිමිදිරිය
4. පුංචි  5. කවඩි, පුංචි, කවිඳු

(05) මම ගෙදර යන විට මොනරෙක් දැක්කා.

(06) නිවැරදිව ලියා ඇති වැකි වලට ලකුනු ලබාදෙන්න.

(07) 1. Arrow  2. Cup (cap)  3. Ball (Bell)

(08) 1. වැසිකිළිය  2. පුස්තකාලය  උංගල් පෙයර් එන්න ?

(09) 1. 12  2. 66

(10) 16

(11) 1. 14  2. 9

(12) 3.  (13) 2

(14) 1. සිලින්ඩරය  2. චතුස්තලය

(15) කොටු 5 ක් පාටකර ඇත්නම් ලකුණු දෙන්න.

(16) 6

(17) 1. වෙහෙර  2. වම් අත පැත්තේ

(18) 8 යි  (19) 6 යි

(20) ඝනකය

## පරිසරය

(01) 2 (ගොටුකොළ)

(02) 3. (උසට නොවැඩේ)

(03) 3 සිංහල

(04) 2 (සීරුවෙන් සිටිය යුතුය)

(05) 1 (කතෝලික)

(06) 2 (ඉස්ලාම්)

(07) 3 (රෝස)

(08) 2 (උණ)

(09) 3 (සතර බ්‍රහ්ම විහරණ)

(10) 1 (කරපිංචා)